**මාසික විශේෂාංගය**

# තවමත් හමු නොවූ අපේ තිඹිරිගෙය

ජීවය ඇති වූයේ පොළොවේ බව දැන් පිළිගන්නා මතය යි. එහෙත් විශ්වයේ යම් තැනෙක ජීවය ඇති වී එය පොළොවට පැමිණි බව කියවෙන මතයක් ද තිබේ. ජීවය පොළොවේ ඇති නොවුණේ නම් එය ඇති වුණේ විශ්වයේ කොතැන ද?

'එය විශ්වයේ තැවුම් ග්‍රහලෝකයකි. ග්‍රහලෝකයේ පාෂාණ ඊයේ පෙරේද බිහිවූවාක් මෙනි. දැන් මේ ග්‍රහලෝකයේ සාගර ද තිබේ. ඒත් ග්‍රහලෝකය මුළුමනින් ම පාළු ය. ඇත්තෙන් ම පාෂාණ හා ජලය හැරෙන්නට වෙන කිසිවක් ම තිබුණේ නැත.

ඒත් මේ පොළොවට උල්කාපාත කඩා වැටෙමින් තිබුණේ ය. විශ්වයේ විවිධ තැන්වලින් ගෙනා ධූලි හලමින් වල්ගාතරු පැයුවේ ය.

මේ වල්ගාතරු මතු නොව උල්කාපාත ද ගෙන එන දේ අතර ජීව බීජ ද තිබුණේ ය. තැවුම් සාගරය ඒවාට තිඹිරිගෙයක් වූයේ ය. වඩා වේගයෙන් මේ මුහුදේ ජීවයක් හට ගත්තේ ය. ඒ කටයුත්ත ඇරඹුණේ අදින් අවුරුදු කෝටි 380 කට කලිනි.

මේ ඡේදය කල්පිත කථාවක් යැයි බොහෝ දෙනෙක් සැලකූ කාලයක් තිබුණේ ය. අනෙක් අතට මේ විස්තර කළේ, පොළොවේ ජීවය ඇති වූ ආකාරය ගැන කියැවෙන එක් වාදයක අන්තර්ගතය පිළිබඳ දළ ආකෘතිය යි. පොළොවේ ජීවය සම්භවය වූ ආකාරය ගැන කියැවෙන මේ වාදය වන්නේ ජීවයේ විශ්ව



ආචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ

සම්භවය (Panspermia) පිළිබඳ වාදය යි. විශ්වයේ පැතිරී තිබෙන ජීවය පිළිබඳ සාධක පොළොවට පැමිණ ඉන් පොළොවේ ජීවය ඇති වුනාක් මිස ජීවය හුදෙක් පෘථිවියට පමණක් ආවේණික, පෘථිවියේ සම්භවය වූ සංවිධානයක් නොවේ යැයි මේ මතයෙන් කියැවෙන්නේ ය.

ඈත විශ්වයේ තිබෙන ජීව ඒකකයක් ක්ෂුද්‍රජීවියෙක් හෝ ක්ෂුද්‍රජීවියකුගේ බීජාණුවක් ජීවය නොනැසී පොළොවට පැමිණීම පිළිගත නොහැකි සිදුවීමක් යැයි මෙතෙක් ලෝකයේ බොහෝ දෙනෙක් පිළිගත් කරුණක් වූයේ ය.

එහෙත් විශ්වයේ ඈත තැනෙක සිට දුෂ්කර ගමනක යෙදී වුවත් මුල්

## ජීවයේ විශ්ව සම්භව මතය



විශ්වයේ සරන ධූවිලි - ග්‍රහලෝක වෙත ජීවයේ මූලික ස්වරූපය මෙම ධූවිලි අංශු මගින් පැමිණි බව විශ්ව සම්භව මතයෙන් කියැවේ

ස්වරූපය වෙනස් නොවුණු බීජාණු ආකාර පොළොවට පැමිණිය හැකි බව කියැවෙන ඒ මතයට රුකුල් ලැබෙන සිදුවීම් දෙකක් පසුගියද ප්‍රසිද්ධ වූයේ ය.

මින් එකක් පර්යේෂණයක් නොව සොයා ගැනීමකි. සොයා ගැනීමට දායක වී සිටින්නේ ඇමරිකා එක්සත් ජනපදයේ පාරිසරික ජීව විද්‍යාඥයන් දෙදෙනෙකු වන රසල් එච්. බ්‍රීලන්ඩ් හා විලියම් රොසෙන්වෙයිග් යන අය යි. මේ අය සොයා ගනු ලැබුයේ අවුරුදු මිලියන 250 ක් පැරණි තවමත් ජීව තත්ත්වයේ තිබෙන බීජාණුවකි. එය ආරක්ෂා වී තිබුණේ ලවන සඵටිකයක් තුළ ය. මේ සොයා ගැනීමෙන් පෙනී යන්නේ ලවන ස්ඵටික තුළ දී විනාශ නොවී බීජාණුවකට පැවතිය හැකි බව ය. වල්ගාතරුවක් මූලික වශයෙන් තැනී තිබෙන්නේ ද මෙවැනි ලවන ස්ඵටික හා වෙනත් ධූලි අංශුවලිනි. ඉදින් මේ වල්ගාතරු තුළට වී ජීවයේ බීජාණුවලට පැවතීමට හැකියාවක් තිබෙන බව මින් පැහැදිලි වේ.

ජීවයේ විශ්ව සම්භව වාදයට රුකුල් දෙන මීළඟ පර්යේෂණය සිදුකොට තිබෙන්නේ කැලිෆෝර්නියා තාක්ෂණ ආයතනයේ හා මැක්ගිල් සරසවියේ පර්යේෂකයින් විසිනි. ඔවුන් පෙන්වා දී තිබෙන්නේ අඟහරු ග්‍රහලෝකයේ සිට පොළොවට පැමිණි පාෂාණ කැබැල්ලක අභ්‍යන්තරය ඒ දිගු ගමන නිසා වෙනස් වී නැති බවයි. එනම් අභ්‍යවකාශයේ දුෂ්කර තත්ත්වය යටතේ පැමිණ පොළොවේ වායුගෝලයේ ගැටීමෙන් පසුව වත් මේ පාෂාණයේ අභ්‍යන්තරය රත් වී නැති බව මේ පර්යේෂකයින් විසින් පසුගියද පෙන්වා දුන්නේ ය. මේ සොයා ගැනීමෙන් පෙනෙන්නේ ද විශ්වයේ ඈත තැනෙක තිබී ජීවයක මූලික ස්වරූපයකට පොළොවට ඒමට හැකියාව තිබෙන බව ය. එය පාෂාණයක් තුළට වී හෝ පොළොවට පැමිණිය හැක්කේ ය.

පසුගියද නිවේදනය වූ මේ පර්යේෂණයෙන් හා සොයා ගැනීම් වලින් පසුව නැවතත් විශ්වයේ සම්භවය පිළිබඳ විශ්ව සම්භව වාදය කථාබහට ලක් වූයේ ය.

මුලින් ම විශ්ව සම්භව වාදය ලෝකයට විද්‍යාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කරනු ලැබුයේ 1857 දී පමණ කෙල්වින් සාමිවරයා විසිනි. එහෙත් ඉන්පසුව නැවතත් වඩාත් විද්‍යාත්මක ස්වරූපයෙන් මේ මතය ඉදිරියට ආයේ 1970 දශකයේ දී ය. මේ කාලයේ දී බ්‍රිතාන්‍ය ජාතික විද්‍යාඥයකු වූ ශ්‍රීමත් ෆ්‍රෙඩ් හොයිල් හා ශ්‍රී ලාංකික විද්‍යාඥයකු වන ආචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ එක්ව ප්‍රකාශ කළේ ජීවයේ විශ්ව සම්භව වාදයට පදනමක් තිබෙන බව ය. එහෙත් එය මෙතෙක් වාද විවාදයන්ට ලක්වෙමින් තිබෙන්නේ ය.

එහෙත් පසුගිය දිනවල දී සිදු කළ සොයා ගැනීම් හා පරීක්ෂණ වලින් තමන්ගේ මතය තහවුරු වන බව ජනමාධ්‍යයන්ට සාකච්ඡාවක් ලබා දෙමින් පසුගිය දිනයක ආචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහයන් විසින් ප්‍රකාශ කළේ ය.

ආචාර්ය චන්ද්‍රා නලින් වික්‍රමසිංහ ජීවයේ විශ්ව සම්භව වාදය වෙනු

වෙත් පෙනී සිටින දැනට ලෝකයේ කීර්තිමත් ම විද්‍යාඥයා යි.

ඔහු දැනට බ්‍රිතාන්‍යයේ කාඩිෆ් සරසවියේ ව්‍යවහාරික ගණිත හා තාරකා ජීව විද්‍යා අංශයේ අධ්‍යක්ෂවරයා ය. ඔහු විසින් ලියන ලද Evolution From Space, Diseases From Space හා The Living Cometsයන ග්‍රන්ථ ඒ විෂයයෙහි ලෝකයේ පළ වූ සවිස්තර හා ජනප්‍රිය ග්‍රන්ථයන් ය.

මෙහි දැක්වෙනුයේ පසුගියදා ආචාර්ය වික්‍රමසිංහයන් වෙත ජනමාධ්‍යවේදියෙක් ඉදිරිපත් කළ ප්‍රශ්න හා ඒවාට ඔහු ලබාදුන් පිළිතුරු යි.

**දැන් තැවතත් විද්‍යාඥයන් ජීවයේ විශ්ව සම්භව මතය ගැන උනන්දුවෙන් කථා කරනවා. මේකට හේතුව මොකක් ද?**

මේකට හේතුව ජීවය පොළවේ සාගරවල ඒ කියන්නේ - ආදී සූපය (Primodialsoup) විදියට හඳුන්වන කාබනික ද්‍රව්‍ය වලින් සරු මුල් කාලීන පෘථිවි මුහුදේ ජීවය ඇති වූ බව තහවුරු නොවන පරීක්ෂණාත්මක සාධක දැන් ලැබී තිබීම යි.

ලෝකයේ ජීවය ඇති වූ බවට තියෙන සාක්ෂිය අවුරුදු මිලියන 3800 ක් විතර පරණයි. අවුරුදු මිලියන 3900 කට කලින් පොළව උල්කාපාත වලින් බැට කමින් තිබුණු ග්‍රහලෝකයක්.

වල්ගාතරුවල දූවිලි නිතරම පොළවට වැටුණා. ඉතින් මේවා තුළින් තමයි ජීවයේ ප්‍රාථමික ස්වරූපයක් පොළවට එන්නට ඇත්තේ.

මේ කථාව අපි 1970 දී කීවා. ෆ්‍රෙඩ් හොයිල්, මම, සමඟ තවත් කීර්තිමත් විද්‍යාඥයින් එක් වෙලා පෙන්වා දුන්නා ජීවය තැනීමට අවශ්‍ය වන මූලික රසායන සංයෝග වල්ගාතරු දූවිලිවල තිබෙන බව. ඒ අනුව අන්තර් තාරකීය දූවිලිවල (Intersteller Dust ) ඒ රසායනික සංයෝග තිබෙන බව. ඒ වගේම රසායනික අණු පමණක් නොව ශීත වී වියළී ගිය ක්ෂුද්‍රජීවීන් පවා මේ ධූලිවල සිටින බව අප පෙන්වා දුන්නා.

ඒත් මේවා කාලයත් සමග වැලලුණු කථා බවට පත් වුණා. ඒත් දැන් මාස කිපයකට කලින් ඇමරිකාවේ ජාතික ගගනවිද්‍යා හා අභ්‍යවකාශ පරිපාලනාධිකාරියේ (NASA – National Aeronautics and Space Administration)විද්‍යාඥයින් ස්ටාර්ඩස්ට්(Stardust)අභ්‍යවකාශ යානය මඟින් එකතු කොට ගත් අන්තර් තාරකීය ධූලි පරීක්ෂා කළා. මේවා වේගයෙන් ඇවිත් ස්ටාර්ඩස්ට් අභ්‍යවකාශ යානයේ අනාවරක(Detectors)මත ගැටී තැත්පත් වූ ඒවා යි. මේ ධූලි අතුරින් ඔවුන් සොයා ගනු ලැබුවා, බැක්ටීරියාවන්ගේ සෛල බිත්තිවල අවශේෂ කොටස්. ඒවගේ ම පසුගිය කාලය මුල්ලේ ම ඉතා කටුක තත්ත්ව යටතේ ජීවත්වීමට හුරු වුණු ක්ෂුද්‍රජීවී විශේෂ සොයා ගෙන තිබෙනවා. ඒ වගේම පසුගිය කාලයේ 'සයන්ස්'(Science)සගරාව වාර්තා කොට තිබුණා අඟහරු වෙතින් පැමිණි උල්කාශ්මයක අභ්‍යන්තරය ඉතා ශීතයි කියා. ඒ වගේම පර්යේෂකයින් සොයා ගෙන තිබුණා අවුරුදු මිලියන 250 ක් පමණ වයසැති බැක්ටීරියා බීජාණුවක්.

ඉතින් මේ කටයුතුවලින් ජීවයේ විශ්ව සම්භවවාදයට තව තවත් සාක්ෂ්‍ය වේගයෙන් ලැබී තිබෙනවා. අලුත් උනන්දුවට හේතුව ඒක යි.

**මීට ටික කාලයකට කලින් NASAආයතනයේ ඇමීස් පර්යේෂණ ආයතනයට (Ames Research Institute)සම්බන්ධව සිටි ආචාර්ය සිරිල් පොන්නම්පෙරුම විශේෂයෙන් පෙන්වාදී තිබුණේ ජීවය ඇතිවුණේ පෘථිවියේ ආදි සූපය තුළ බව යි. ඔබේ වාදයෙන් මේ වාදය (ජීවයේ කාබනික සම්භව වාදයට) වෙනස් වෙන්නේ ඇයි.**

*අප තර්ක කරන්නේ ජීවය පෘථිවියේ ආරම්භ නොවූ බවට යි. දැන් ලැබෙන සාක්ෂි අපේ මේ මතයට එකඟ යි. ජීවය කියන්නේ විශ්වයේ අපි දකින ඉතා ඉහළ හා සංකීර්ණ පද්ධතියක්. අජීවී ද්‍රව්‍ය වලින් මෙවැනි සංකීර්ණ පද්ධතියක් තැනෙන්න ඉතා සුවිශේෂ තාරකා විද්‍යාත්මක බලවේගයක් ක්‍රියාත්මක විය යුතුයි කියා අප විශ්වාස කරනවා. එවැනි විස්මකර්ම වැඩක් පොළොවේ දී සිදුවිය නොහැකි යි. එවැනි දෙයක් සිදුවෙන්න පොළොව කුඩා වැඩියි. අවශේෂ සම්පත්වලින් හීනයි.*

අපේ වාදය කාබනික සම්භවවාදයෙන් සම්පූර්ණයෙන් ම වෙනස්. අපි තර්ක කරන්නේ ජීවය පෘථිවියේ ආරම්භ නොවූ බවට යි. දැන් ලැබෙන සාක්ෂි අපේ මේ මතයට එකඟ යි. ජීවය කියන්නේ විශ්වයේ අපි දකින ඉතා ඉහළ හා සංකීර්ණ පද්ධතියක්. අජීවී ද්‍රව්‍ය වලින් මෙවැනි සංකීර්ණ පද්ධතියක් තැනෙන්න ඉතා සුවිශේෂ තාරකා විද්‍යාත්මක බලවේගයක් ක්‍රියාත්මක විය යුතුයි කියා අප විශ්වාස කරනවා. එවැනි විස්මකර්ම වැඩක් පොළොවේ දී සිදුවිය නොහැකි යි. එවැනි දෙයක් සිදුවෙන්න පොළොව කුඩා වැඩියි. අවශේෂ සම්පත්වලින් හීනයි.

**ජීවය පොළොවේ ආදි සූපයේ තැනුනේ නැත්නම් එය ආරම්භ වුණේ කොහෙද?**

මම හිතන්නේ ජීවය මුලින් ම පැවතෙන්න ඇත්තේ විශ්ව පරිමාණයෙන් මැනිය හැකි තැනකින් කියා යි. එය පැහැදිලි කරන්න විශ්වයේ තිබෙන සියළුම දේ පිළිබඳ දැනුමක් අවශ්‍ය වේවි. මම හිතන්නේ විශ්වයේ සම්භවයෙන් පසුව ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරීත්වය ඇරඹෙන්න ඇති කියා යි. විශ්වය පුරා පැතිරුණ අන්තරීක්ෂ ධූලි ((Cosmic dust)මේ බැක්ටීරියාවන් විශ්වය පුරා ගෙන යන්න ඇති කියා යි. මේ ක්ෂුද්‍රජීවීන්ගෙන් සියයට 99.9999999 ක් මිය ගියත් ප්‍රශ්නයක් නැහැ. ඉතිරිවන ස්වල්පය යම් තැනෙක ජීවයක් ඇති කරන්න ප්‍රමාණවත්. බැක්ටීරියාවන්ට තිබෙන්නේ දෙගුණ වීමේ පුදුමාකාර හැකියාවක්. ඒ වගේම දුෂ්කර තත්ත්ව යටතේ ජීවත්වීමේ හැකියාවක්.

**ජීවය පොළොවට ම විශිෂ්ඨ එකක් නොවේ නම් විශ්වයේ අනෙක් තැන්වල විසිය හැකි බුද්ධිමත් ජීවීන් ගැන ඔබ හිතන්නේ මොනවා ද?**

පොළොවට අභ්‍යවකාශයෙන් ජීවය පැමිණියේ අවුරුදු මිලියන 4000 කට කලින් වුවත් එය දැනුත් පොළොවට පැමිණෙමින් පවතිනවා. මම හිතනනේ මේ විදියට දිගින් දිගට ම සිදුවුණු බැක්ටීරියාවන්ගේ පැමිණීම මඟින් පෘථිවියේ ජීව පරිණාම ක්‍රියාවලිය මෙහෙයවන්න ඇති කියා යි.

*පොළොවට අභ්‍යවකාශයෙන් ජීවය පැමිණියේ අවුරුදු මිලියන 4000 කට කලින් වුවත් එය දැනුත් පොළොවට පැමිණෙමින් පවතිනවා. මම හිතනනේ මේ විදියට දිගින් දිගට ම සිදුවුණු බැක්ටීරියාවන්ගේ පැමිණීම මඟින් පෘථිවියේ ජීව පරිණාම ක්‍රියාවලිය මෙහෙයවන්න ඇති කියා යි. අපි වගේ බුද්ධිමත් ජීවීන් ඇතිවුණොත් මේ ක්‍රියාවලිය නිසාම යි.*

අපි වගේ බුද්ධිමත් ජීවීන් ඇතිවුණොත් මේ ක්‍රියාවලිය නිසාම යි. මම හිතන්නේ මේ බුද්ධිමය ජාන සම්පත් විශ්වය පුරාම තිබෙන ග්‍රහලෝකවලට වර්ෂාවක් වගේ වැටෙනවා ඇති කියල යි. ඒ වගේම නූතන තාරකා විද්‍යාවෙන් දැනගෙන තිබෙනවා විශ්වයේ තැන් තැන්වල ග්‍රහලෝක නිර්මාණය වෙමින් තිබීම විශ්වයේ සම්භවයක් කියා. මේ වන විට පොළොවට පිටින් තිබෙන එවැනි ග්‍රහ පද්ධතීන් බොහොමයක් සොයා ගෙන තිබෙනවා. ඒවගේ ම අපේ සූර්යයා වගේ තාරකා බිලියන 100 ක් පමණ විශ්වයේ තිබෙන බව තාරකා විද්‍යාඥයින් දන්නවා. ඒ වගේම අපේ සූර්යග්‍රහ මණ්ඩලය වගේ ග්‍රහලෝක පද්ධතීන් බොහොමයක් තිබෙන බව දන්නවා. ඉතින් අපේ ක්ෂීරපථ මන්දකිණියේ පමණක් පෘථිවිය වගේ ග්‍රහලෝක බිලියන ගණනක් තිබිය යුතුයි. ඉතින් මේවා මතත් බුද්ධිමත් ජීවීන් සිටිය හැකියි. ඉතින් මේ පදනමින් මම හිතන්නේ විශ්වය පවතින්නේ

බුද්ධිමත් හෝ සුපිරි බුද්ධිමත් ජීවීන් සහිත පද්ධතියක් විදියට කියලයි.

**තවමත් ජීවයේ සම්භවය පිළිබඳ විශ්ව සම්භව වාදය විද්‍යාත්මක වාදයක් විදියට විද්‍යාඥයින් පිළිගත්තේ නැහැ. ඔබට කියන්න පුළුවන්ද ෆ්‍රෙඩ් හොයිල්ගෙන් පස්සේ ඒ මතයට සිදුවී තිබෙන දේ ගැන?**

මම බොහොමයක් හේතු කලින් කීවා. මේ මතය සනාථ වන්න ඒවා ප්‍රයෝජනවත් වේවි. මුලින්ම කියන්න ඕනැ පොළොවේ තිබුණු තත්ත්ව යටතේ එහි ජීවයක් ඇතිවීම ඇත්තෙන් ම අපහසු කටයුත්තක්. ඒවගේ ම අන්තර්තාරකීය ධූලි තුළ දී වගේම වල්ගාතරු වලදීත් කාබනික සංයෝග සොයාගෙන තිබෙනවා. 1980 දශකය අවසන් වන විට අන්තරික්ෂ ධූලිවල බැක්ටීරියාවන්ගේ අපද්‍රව්‍ය වගේ ම ශීත වී ගිය බැක්ටීරියා සෛල තිබෙන බව පැහැදිලිව පෙනී ගියා. අඟහරුවලින් පැමිණි උල්කාශ්මයේ එහෙම තිබුණෙත් ඒ දේවල් තමයි.

**ජීවයට වෙනත් තැනෙක සිට පොළොවට පැමිණෙන්න පුළුවන් නම් පොළොවේ තිබෙන ජීවයටත් විශ්වයේ වෙනත් ග්‍රහලෝක වෙතට යන්න පුළුවන් ද?**

ඔව්. මම හිතන්නේ ඒ දේ වෙන්න පුළුවන් කියලයි. පෘථිවියේ පරිණාමයේ දී විවිධ අවස්ථාවල තිබූ ජීවය පොළොවෙන් නික්මී වෙනත් ග්‍රහලෝක වෙත ගමන් කරන්න පුළුවන්කම තිබෙනවා. අඟහරු ග්‍රහලෝකයෙන් පොළොවට පැමිණි ග්‍රාහකයෙන් කියවෙන්නේ ඒ හැකියාව ගැනයි. අපේ සූර්යග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතරින් ජීවය පැතිරෙනවා කියන එක ඉන් තහවුරු වෙනවා.

**රසල් වීලන්ඩ් හා ඔහුගේ සහයකයින්ගේ කටයුතු, මඟින් අවුරුදු මිලියන 250 ක් පැරණි ක්ෂුද්‍රජීවීන් සොයා ගැනීමත් කැල්ටෙක් පර්යේෂක ජෝසප් කර්ෂ්වින්ක් ගේ පර්යේෂණත් ඒ වගේම අඟහරු ග්‍රහලෝකයෙන් පොළොවට පැමිණි උල්කාෂ්මයේ තොරතුරු ගැනත් ඔබ හිතන්නේ මොනවා ද?**

මම හිතන්නේ ඒ හැම එකකින් ම අපේ වාදයට සාක්ෂි ලැබෙනවා කියල යි.

**ඔබට කියන්න පුළුවන් ද ස්ටාර්ඩස්ට් Stardust ව්‍යාපෘතිය දියත් කිරීමෙන් පසුව ඉන් වල්ගාතරුවලින් එකතු කොට ගත්තා ධූලි මඟින් ජීවයේ සම්භවය පිළිබඳ ස්වයංසිද්ධ සම්භවවාදයට ලැබෙන සාක්ෂි මොනවද කියා ?**

ස්ටාර්ඩස්ට් ව්‍යාපෘතිය ජීව අංශු අල්ලා ගැනීමට තරම් සාර්ථක වේදැයි කියන්න බැහැ. ඒත් එහි ධූලි එකතු කර ගැනීමේ ක්‍රමය හොඳ සාර්ථක ක්‍රමයක්. කොහොම නමුත් එහි ගැටෙන අංශු වලින් ජීවයට සාක්ෂි ලැබෙන බව දැනටමත් දන්නා කරුණක්. අනාගතයේ දී ඒ යානයෙන් ධූලි සාම්පල ගෙන ආ පසුත් ඒ අදහස් වෙනස් වෙන එකක් නැහැ.

**පසුගිය 2000 මාර්තුවේ ඉන්දියාවේ අභ්‍යවකාශ පර්යේෂණ මධ්‍යස්ථානයේ (ISRO- Indian Space Research Organisation) පර්යේෂකයින් අන්තර් තාරකීය ධූලි එකතු කිරීමට බැලූනයක් ගුවන්ගත කිරීමට සැලසුම් කළා.**

**ජීවයේ සාධක නිරන්තරයෙන් ම පොළොවට පැමිණෙන බව ඔප්පු කිරීමයි ඔවුනගේ අදහස වුණේ. අනෙක් අතට පිටසක්වලින් පොළොවට පැමිණෙන බැක්ටීරියා වලින් පොළොවේ ජීවීන්ට රෝග සෑදේ දැයි සොයා බැලීමටත් ඔවුන් අදහස් කළා. මේ වැයම ඔබ දකින්නේ කොහොම ද?**

මම හිතන්නේ මේ වැයම ඉතා හොඳ එකක්. වල්ගාතරු පැයූ පසුව පොළොවේ ශාක වලටත් සතුන්ටත් ආගන්තුක රෝග පැතිරෙන බවට කථා පුරාවෘත්ත විදියටත් තිබෙනවා. සමහරවිට මේ පර්යේෂණ මඟින් එය තහවුරු කරන්න යම් සාක්ෂියක් ලැබෙන්න පුළුවන්. ඉතින් මේ මඟිනුත් සාධක ලැබෙන්නේ ජීවය පොළොවට පැමිණියේ විශ්වයේ යම් තැනකින් කියන වාදය යි. ❑

**සිංහලයට නැඟුවේ**

# වසර 2000 හොඳම විද්‍යා ලේඛක සම්මානය

## පාලිත අමරසූරියට

ශ්‍රී ලංකාවේදී විද්‍යාව ජනප්‍රිය කිරීමේ යෙදුණු හොඳම විද්‍යා ලේඛකයාට ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මඟින් පිරිනමන සම්මානය මෙවර පාලිත අමරසූරිය මහතාට පිරිනමා තිබේ.



පේරාදෙණිය සරසවියේ දී පැවැත් වූ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 56 වෙනි වාර්ෂික සැසියේ සමාරම්භක උළෙලේ දී එම සම්මානය පිරිනමනු ලැබී ය. එම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ, ඉන්දියාවේ ජාතික විද්‍යා ඇකඩමියේ අධිපති හා ඉන්දීය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂවරයා වන මහාචාර්ය ගොවර්දන් මේතා මහතා ය.

මෙවර ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සම්මානය හිමි කරගත් පාලිත අමරසූරිය මූලික අධ්‍යාපනය ලැබුයේ බදුල්ල හිඟුරුගමුව සිරිසුමන විදුහලෙනි.

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලැබුයේ බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයෙනි. ඒ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිරිනැමෙන ශිෂ්‍යත්ව දෙකක් දිනූ ශිෂ්‍යත්වධාරියකු වශයෙනි. අ.පො.ස (උ/පෙළ) විශිෂ්ට ලෙස සමත්වෙමින් ද්විතීයික අධ්‍යාපනය හමාර කළ ඔහුගේ දීප්තිමත් අධ්‍යාපන ඉතිහාසය වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා ඕස්ට්‍රේලියානු ආයතනික ශිෂ්‍යත්වය ඔහුට පිරිනැමුණේ ඉන් පසුව ය. ඒ ඕස්ට්‍රේලියාවේදී වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා ය.

එසේම ඔහු විසින් සම්පාදනය කළ විශේෂාංග ලිපි දහසකට ආසන්න සංඛ්‍යාවක් නවයුගය, විදුසර, දිවයින, වත්මන, ලක්බිම, සමුදුර හා දෙසතිය යන ජාතික පුවත්පත් හා සඟරාවල පළවී තිබේ.

මෙවර ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය ඔහුට සම්මාන ප්‍රදානය කළේ සිංහලෙන් විද්‍යාව ජනප්‍රිය කිරීම සඳහා ඔහු විසින් කළ ඒ කටයුතු ඇගයීමක් වශයෙනි. ❑